සියලු හිමිකම් ඇවිරිණි/ All Rights reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
**Provincial Department of Education - NWP**

**50 S I**

පළමු වාර පරීක්ෂණය - 10 ශ්‍රේණිය - 2018
First Term Test - Grade 10 - 2018

විභාග අංකය .................................... **නාට්‍ය හා රංග කලාව I** කාලය පැය එකයි

**සියළුම ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.**
**පහත දැක්වෙන පද්‍ය ඇසුරින් 01 සිට 05 දක්වා ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.**

**A.** **දීකිරි දීකිරි ගෙනාවා දීකිරි**
**මිහිපිට කාටත් ගුණදෙන දීකිරි**

**B.** **ඇහැළ මලින් ගස් පිරිලා බලන්න හරි ලස්සනයි**
**අඹ රඹුටන් ජම්බු ඉදිලා අද හැමතැන හරි හැඩයි**

**C.** **සත් අවුරුද්දක් මෙහෙකර ගත්ත මගෙ අඹු සිගිත්ත**
**සමඟ ආමි ගමට යන්න මං මගෙ හාමුදුරුවෝ**
**සමඟ ආමි ගමට යන්න මං**

**D.** **ප්‍රේමයෙන් මන රංජිතවේ නන්දිතවේ**
**පුෂ්පයෙන් වන සුන්දරවේ ලංකෘතවේ**

(01) මෙහි නාට්‍ය ධර්මී ශෛලියට අයත් නාට්‍යකට අයත් ගීත වන්නේ,
1. AB 2. BC 3. CD 4. DB

(02) දයානන්ද ගුණවර්ධන මහතාගේ නාට්‍යයකින් උපුටාගත් ගීතයක් වන්නේ,
1. A 2. B 3. D 4. C

(03) මෙහි C ගායනය ඉදිරිපත් කරන චරිතය වන්නේ
1. දික්තලා 2. කාලගෝල 3. නරියා 4. දික්පිටියා

(04) මෙහි A ගීතය උපුටා ගන්නා ලද නාට්‍යය වන්නේ,
1. රතු හැට්කාරී 2. දීකිරි 3. නරිබෑනා 4. තාරාවෝ ඉගිලෙති

(05) මෙහි D ගීතය අයත් නාට්‍ය නිර්මාණය කරන ලද්දේ,
1. හෙන්රි ජයසේන 2. දයානන්ද ගුණවර්ධන
3. පුන්‍යසේන ගුණසිංහ 4. එදිරිවීර සරච්චන්ද්‍ර

**නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**

(06) ප්‍රාසාංගික කලාවක් නොවන්නේ,
1. චිත්‍රපට 2. බැලේ 3. ඔපෙරා 4. සංගීත ප්‍රසංග

(07) දෘශ්‍ය කලාවකි.
1. ටෙලිනාට්‍ය 2. නූර්ති 3. නර්තන 4. චිත්‍රපට

(08) භරත නාට්‍යම් අයත් වන්නේ,
1. නෘත්තට 2. නෘත්‍යට 3. නාට්‍යයට 4. නෘත ට

(09) කථාන්තරයක් අසා රස විඳින පිරිස හඳුන්වන්නේ,
1. පාඨකයන් ලෙස. 2. ප්‍රේක්ෂකයන් ලෙස.
3. ශ්‍රාවකයන් ලෙස. 4. විචාරකයන් ලෙස.

(10) නිර්මිත චලනයකි,
1. උඩපැනීම. 2. දිවීම. 3. නැවීම. 4. නොන්ඩි ගැසීම.

(11) හිමකන්ද දියවීම අභ්‍යාසය හඳුන්වන්නේ,
1. ගිලීලකරණ අභ්‍යාසවලට. 2. මානසික අභ්‍යාසවලට.
3. සංවේදන අභ්‍යාසවලට. 4. ස්වසන අභ්‍යාසවලට.

(12) "මෝරු" රංග ක්‍රීඩාවේ නිරත වූ ශිෂ්‍යයෙකු තුළ වර්ධනය වී ඇතැයි සිතිය නොහැකි දක්ෂතාවය වන්නේ,
1. ක්ෂණික තීරණ ගැනීමේ හැකියාව. 2. අවධානය.
3. සවන්දීම. 4. සාමූහික බව.

(13) හනික වරෙව් කොල්ලනේ මෙන්න මෙහෙ වරෙව්............ ගීතය ඇතුළත් වන්නේ,
1. මූදු පුත්තු නාට්‍යයේය. 2. සිංහබාහු නාට්‍යයේය.
3. නරිබෑනා නාට්‍යයේය. 4. බෙරහඬ නාට්‍යයේය.

(14) නාට්‍ය ධර්මී නාට්‍යයකට නිදසුනකි.
1. මූදු පුත්තු. 2. සිංහබාහු. 3. නරිබෑනා. 4. තාරාවෝ ඉගිලෙති.

(15) නාට්‍ය ගීත අයත්වන අභිනය වන්නේ,
1. වාචික අභිනය. 2. සාත්වික අභිනය. 3. ආංගික අභිනය. 4. ආහාර්ය අභිනය.

පහත වගුව ඇසුරු කරගෙන 16 - 20 දක්වා ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

| A | B | C |
|---|---|---|
| ක | හෙන්රි ජයසේන | කුවේණි |
| 1974 | සයිමන් නවගත්තේගම | ග |
| 1961 | ජ | බෙරහඬ |
| 1964 | ට | තට්ටු ගෙවල් |
| ඩ | පරාක්‍රම කිරිඇල්ල | සෙක්කුව |

(16) "ක" හිස්තැනට සුදුසු වර්ෂය වන්නේ,
1. 1962 2. 1961 3. 1980 4. 1964

(17) "ග" හිස්තැනට සුදුසු නාට්‍යය වන්නේ,
1. පුස්ලෝබං 2. සුභ සහ යස 3. මකරාක්ෂයා 4. සුදු සහ කළු

(18) "ජ" හිස්තැනට සුදුසු නාට්‍ය ශිල්පියා වන්නේ,
1. හෙන්රි ජයසේන 2. එදිරිවීර සරච්චන්ද්‍ර
2. දයානන්ද ගුණවර්ධන 4. බන්ධුල ජයවර්ධන

(19) "ට" හිස්තැනට සුදුසු නාට්‍ය ශිල්පියා වන්නේ,
1. සුගතපාල ද සිල්වා 2. රංජිත් ධර්මකීර්ති
2. ගුණසේන ගලප්පත්ති 4. එදිරිවීර සරච්චන්ද්‍ර

(20) "ඩ" හිස්තැනට සුදුසු වර්ෂය වන්නේ,
1. 1976 2. 1978 3. 1980 4. 1964

නිවැරදි පිළතුර යටින් ඉරක් අඳින්න.

(21) රටයකුම ශාන්ති කර්මයේ එන නාට්‍යමය පෙළපාළියකි.
1. කළස් පාලිය 2. සළු පාලිය 3. දොළහ පෙළපාලිය 4. දහඅට පාළිය

(22) වඩිග පටුන නම් නාට්‍යමය අවස්ථාව ඇතුළත් ශාන්ති කර්මය වන්නේ,
1. දහඅට සන්නිය 2. සන්නි යකුම 3. රට යකුම 4. සූනියම් යාගය

(23) පහතරට සම්ප්‍රදායේ කාන්තාවන් වෙනුවෙන් පවත්වන ශාන්තිකර්මය වන්නේ,
1. රිද්දියාගය 2. සූනියම 3. දහඅට සන්නියයි. 4. සන්නියකුම

(24) "මැණික්පාල බිසව හා සම්බන්ධ පුරාවෘත්ත කථාව ඇතුළත් ශාන්ති කර්මය හඳුන්වන්නේ,
1. සන්නියකුම 2. රටයකුම 3. සූනියම 4. දහඅට සන්නියයි.

(25) රටයකුම ශාන්ති කර්මයේ ඇතුළත් නාට්‍යමය අවස්ථාවක් වන්නේ,
1. කපුයක්කාරිය 2. වඩිගපටුන 3. ගුරුගේ මාලාව 4. යක්තම්

26 සිට 30 දක්වා ප්‍රශ්න සඳහා දී ඇති ප්‍රකාශය හරිනම් ( ✓ ) ලකුණද වැරදි නම් (X) ලකුණද ඉදිරියේ ඇති වරහන් තුළ යොදන්න.

(26) දර්පණ අභ්‍යාසය මගින් ක්ෂණිකව ක්‍රියාත්මකවීමේ හැකියාව දියුණුකරගත හැකිය. ( )


(27) ශිථිලකරණ අභ්‍යාසය තුළින් සාමූහික බව වර්ධනය කරගත හැකිය. ( )


(28) චිත්‍රපට ප්‍රාසාංගික කලාව යටතට ගැනේ. ( )

(29) මූර්ති දෘෂ්‍ය කලාවකි. ( )

(30) රූපවාහිනී නාට්‍ය සජීවී කලවකි. ( )

**පහත සඳහන් ඡායාරූප ආශ්‍රයෙන් 31 සිට 35 දක්වා ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.**


A


B


C


D

(31) "කුවේණි" නිර්මාතෘවරයා දැක්වෙන්නේ,
1. B වලිනි 2. A වලිනි 3. D වලිනි 4. C වලිනි

(32) B ඡායාරූපයේ දැක්වෙන්නේ,
1. විජේරත්න වරකාගොඩ 2. හෙන්රි ජයසේන
3. පරාක්‍රම කිරිඇල්ල 4. දයානන්ද ගුණවර්ධන

(33) D ඡායාරූපයේ දැක්වෙන රංගන ශිල්පියා වන්නේ,
1. කෞෂල්‍යා ප්‍රනාන්දු 2. මැණිකේ අත්තනායක
3. සෝමලතා සුබසිංහ 4. මානෙල් ජයසේන

(34) මේ අතරින් ජන කරළියේ නිර්මාතෘ දැක්වෙන්නේ,
1. A වලිනි 2. B වලිනි 3. C වලිනි 4. D වලිනි

(35) C ඡායාරූපයෙන් දැක්වෙන්නේ,
1. ඩග්ලස් රණසිංහ 2. හෙන්රි ජයසේන
3. සුගතපාල ද සිල්වා 4. විජේරත්න වරකාගොඩ

**36 සිට 37 දක්වා ප්‍රශ්න වල වැරදි වරණය තෝරන්න.**

(36) "ප්‍රේක්ෂකයාට" නොගැලපෙන ප්‍රකාශය වන්නේ,
1. නාට්‍ය නිෂ්පාදනයේදී වැදගත් වන පුද්ගලයෙකි.
2. නාට්‍යයක් නරඹා රස විඳින පුද්ගලයායි.
3. ප්‍රේක්ෂකයින් සැමදෙනාගේ රසවින්දනය සමාන වේ.
4. ප්‍රේක්ෂක ප්‍රතිචාර නාට්‍යයේ පැවැත්මට උපකාරීවේ.

(37) රංග ක්‍රීඩා සම්බන්ධයෙන් නොගැලපෙන ප්‍රකාශය වන්නේ,
1. සාමූහික බව වර්ධනය කරගත හැකිය. 2. ක්‍රීඩා කෞශල්‍යය වැඩි දියුණුකරගත හැකිය.
3. රඟපෑම සඳහා පෙර පුහුණුවක් ලැබේ. 4. ඉවසීම ප්‍රගුණ කළ හැකිය.

(38) ලී කෙළි නැටුම අයත් වන්නේ,
1. නෘත වලට 2. නෘත්‍ය වලට 3. නාට්‍ය වලට 4. චලන වලට

(39) අභිනය ගණනින්,
1. පහකි 2. දෙකකි 3. හතරකි 4. අටකි

(40) නාට්‍ය ගීත අයත් වන්නේ,
1. ආහාර්ය අභිනයට 2. වාචික අභිනයට 3. ආංගික අභිනයට 4. සාත්වික අභිනයට

# නාට්‍ය හා රංග කලාව II

**කාලය පැය දෙකයි**

**උපදෙස්**
**⋆පළමු ප්‍රශ්නය ඇතුළුව තවත් ප්‍රශ්න 05කට පිළිතුරු සපයන්න.**

(01) පහත සඳහන් නාට්‍ය ගීත ඇසුරෙන් පළමුවන ප්‍රශ්නයට පිළිතුරු සපයන්න.

I. ආලේ බැන්ද මාගේ රම්‍ය වන් ආ....... //
අවුරුදු සතක් දුකින මෙහෙවර කර මෙමා
ගත් ලඳුන් මගේ - ඇගෙ රූපෙ බෝ අගේ

II. මට මොටද වදේ - මොටද වදේ
සුරිඳ බලන්න අහෝ මා දේසේ
නටන්න වාගේ මේ කළු මිට්ටා
වාහේ අපොයි - මගේ වාහේ අපොයි
සුරිඳ බලාලා මා රැකදේවා

i. ඉහත සඳහන් ගීත දෙක උපුටා ගෙන ඇත්තේ කුමන නාට්‍යයෙන්ද? (01)
ii. එම නාට්‍යයේ වත්මන් නිෂ්පාදකවරයා නම් කරන්න. (01)
iii. නාට්‍යයේ මෙම ගීත දෙක ඉදිරිපත් කරන චරිත දෙක නම් කරන්න. (02)
iv. මෙහි පළමු කවියට අනුව බිරිඳ ලබාගැනීම සඳහා එම පුද්ගලයා යොදාගෙන ඇති උපක්‍රමය කුමක්ද? (02)
v. මෙහි දෙවන කවියෙන් "වාගේ" හා "සුරිඳ" යනුවෙන් හඳුන්වන්නේ කවුද? (02)
vi. මෙහි පළමුවන සහ දෙවන ගායන ඉදිරිපත් කරන චරිතදෙකේ සිතුවිලි වලින් පැහැදිලි වන්නේ කුමක්ද? (04)

(02) දික්තල කාලගෝල නාට්‍යයේ පිටපතක් හා "හීල්බත් දංකුඩ" නම් කතාන්දර පොත පන්තියට ගෙන ආ ගුරුතුමී පන්තියේ සිසුන් කණ්ඩායම් දෙකකට වෙන්කර ඒවා කියවීමට යොමු කළාය.

I. ඔබ දන්නා වෙනත් නාට්‍ය පිටපතක් හා කතාන්දරයක් නම් කරන්න. (02)
II. කතාන්දරයක හා නාට්‍යයක අඩංගු සමානතා 02ක් හා අසමානතා 02ක් ලියන්න. (04)
III. කතාන්දරයකට වඩා නාට්‍යයක ඇති සුවිශේෂී ලක්‍ෂණ මොනවාදැයි විස්තර කරන්න. (06)

(03) චිත්‍ර, නර්තන, මූර්ති, චිත්‍රපට, බැලේ, මුද්‍රා නාට්‍ය, කැටයම්, ඔපෙරා, සංගීත ප්‍රසංග, වේදිකා නාට්‍ය, කාටූන්, රූපවාහිනී නාට්‍ය ආදිය රස විඳිය හැකි කලාවන් ලෙස දැක්විය හැකිය.

I. මේවා අතරින් දෘශ්‍ය කලාවන් වෙන්කර ලියන්න. (02)
II. ඒ අතරින් සජීවී කලාවන් වෙන්කර ලියා ඒවා හඳුන්වන නම ලියන්න. (04)
III. සජීවී කලාවන් අතරින් නාට්‍ය කලාවේ ඇති සුවිශේෂීතාවයන් විස්තර කරන්න. (06)

(04) සැහැල්ලු ඇඳුම් වලින් සැරසුන ළමෝ නිදහස් අවකාශයට ගෙන ආ ගුරුතුමී ළමුන් රවුමට සිටුවා නිය, බෙල්ල, පපුව, උදරය, ඉන, දණිස්, පාද ආදිය ක්‍රමානුකූලව සැහැල්ලු කිරීමට සැලැස්වීම.

I. මෙම රංග අභ්‍යාසය අයත් වන්නේ කුමන රංග අභ්‍යාස වලටද? (02)
II. ඔබ දන්නා රංග ක්‍රීඩා 04ක් නම් කරන්න. 04)
III. රංග අභ්‍යාස කිරීමෙන් නළුවාට ඇති වන ප්‍රයෝජන මොනවාදැයි විස්තර කරන්න. (06)

(05) නාට්‍ය කලාවේ පෝෂණය සඳහා දේශීය ශාන්තිකර්ම වලින් ලැබුණේ ප්‍රබල පිටුවහලකි.

I. නාට්‍යමය ලක්‍ෂණ ඇතුළත් පහතරට සම්ප්‍රදායේ ශාන්ති කර්ම දෙකක් නම් කරන්න. (02)
II. එම ශාන්ති කර්ම දෙකට ඇතුළත් වන නාට්‍යමය අවස්ථාවන් 01 බැගින් නම් කරන්න
III. ඉන් එක් නාට්‍යමය අවස්ථාවක ඇතුළත් නාට්‍යමය ලක්‍ෂණ 03ක් විස්තර කරන්න. (06)

(06) පහත සඳහන් කතා සැකිල්ල ඔබට කැමති පරිදි අවසානයක් කරා ගෙනයමින් නාට්‍ය පෙළක් රචනා කරන්න. (04)
ළමා නිවාසයක ජීවත් වන සඳමාලි මාපිය දෙපළම අහිමි වූ අහිංසක දැරියකි. මේ නිසා පාසලේදී නිතර නිතර හිරිහැරයට පත්වන ඇයට පාසල් ජීවිතය එපාවී තිබිණ. දිනක් එබඳු විහිළුවකින් ඇස් රතු කරගෙන සිටි සඳමාලිට හදිසියේ විදුහල්පතිතුමියගෙන් කැඳවීමක් ලැබී කාර්යාලයට ගියවිට........................

I. සුදුසු මාතෘකාව හා නිශ්චිත අවකාශය (04)
II. නාට්‍යෝත්වික අවස්ථා නිර්මාණයට (04)
III සංවාද දෙබස් සහිත පෙළ රචනයට (04)

පළමු වාර පරීක්ෂණය - 2018
නාට්‍ය හා රංග කලාව - 10- ශ්‍රේණිය
පිළිතුරු පත්‍රය

## I කොටස

| | | | |
|---|---|---|---|
| 01. 3 | 11. 1 | 21. 3 | 31. 2 |
| 02. 2 | 12. 3 | 22. 4 | 32. 3 |
| 03. 2 | 13. 4 | 23. 1 | 33. 4 |
| 04. 1 | 14. 2 | 24. 3 | 34. 2 |
| 05. 4 | 15. 1 | 25. 1 | 35. 4 |
| 06. 1 | 16. 1 | 26. ✓ | 36. 3 |
| 07. 2 | 17. 2 | 27. ✕ | 37. 2 |
| 08. 2 | 18. 4 | 28. ✕ | 38. 1 |
| 09. 3 | 19. 1 | 29. ✓ | 39. 3 |
| 10. 4 | 20. 1 | 30. ✕ | 40. 2 |

## II කොටස

01) i. දික්තල කාලගෝල නාට්‍යයෙන් (01)
ii. පුණ්‍යසේන ගුණසිංහ මහත්මා (01)
iii. කාලගෝල හා දික්තලා (02)
iv. අවුරුදු හතක් බැලමෙහෙවර කිරීම, වැඩකිරීම හා සමාන පිළිතුරක් (02)
v. වාහේ - මහත්තයා, පුරුෂයා ස්වාමි පුරුෂයා
සුරිඳ දෙවියා (02)
vi. පළමු කවියේ කාලගෝල සතුටින්
දෙවන කවියේ දික්තලා දුකින් (04)

(02) I. නරිබෑනා, කදාවළලු, මනමේ........ ආදී නාට්‍යය හා පුහුල් හොරා, අන්දරේ සීනි කෑම......... ආදී ළමයා නම් කරන ලද පිළිගත හැකි පිළිතුරකට (02)

II. සමානතා
- ★ චරිත අඩංගුවීම.
- ★ යම්කිසි කථා වස්තුවක් තිබීම.
- ★ සමාජයට යම් පණිවිඩයක් දීම.
- ★ සිද්ධි මාලාවක් තිබීම.

අසමානතා
- ★ කථාන්දරය කියවා අසා රසිවිඳීමටත් නාට්‍යයක් අසා නරඹා රස විඳීමත්
- ★ කතාන්දරයකට වඩා නාට්‍යයේ චරිත හා සංවාද ප්‍රබලවීම.
- ★ නාට්‍යයේ සීමිත චරිත ප්‍රමාණයක් තිබීම හා කතාන්දරයක් එසේ නොවීම.
- ★ නාට්‍යයක් කෙටි කාලයකින් නිමවන අතර, කතාන්දරයක් දීර්ඝ කාල පරාසයක විහිදීම.
- ★ නාට්‍යයක චරිත නිරූපණයක් ඇති අතර, කතාන්දරයක් එසේ නොවීම.......... ආදී පිළිතුරු සඳහා ලකුණු ලබාදෙන්න. (04)

III.
- ★ චරිත ප්‍රබල විම.
- ★ සීමිත චරිත සංඛ්‍යාවක් තිබීම.
- ★ සංවාද ප්‍රබල වීම.
- ★ මතුපිට පෙනෙන අර්ථයට වඩා ව්‍යාංගාර්ථයක් තිබීම.
- ★ ප්‍රේක්ෂකයාට රසයක් හා ජීවනාවබෝධයක් ලබාදීම.
- ★ සීමිත කාලයක් තුළ ඉදිරිපත් කිරීම.

කරුණු 06 ලිවීමට ලකුණු (06)
කරුණු 06 ලියා විස්තර කිරීමට ලකුණු (06)

(03) I. චිත්‍ර, මූර්ති, කැටයම් (02)

II. ප්‍රාසාංගික කලා - නර්තන, බැනර්, මුද්‍රා නාට්‍ය, ඔපෙරා, සංගීත ප්‍රසංග, වේදිකා නාට්‍ය (04)

III.
- ★ එක් වේලාවක එක් ස්ථානයක පමණක් රඟ දැක්වීම
- ★ ගබඩාකර තබාගත නොහැකිවීම.
- ★ රසයක් මෙන්ම ජීවිතාවබෝධයක් ලැබීම.
- ★ සියළු කලාංගයන්ගෙන් සම් මිශ්‍රණයක් වීම.
- ★ සාමුහික කලාවක් වීම.
- ★ සතර අභිනය ප්‍රබලව යොදාගනී.
- ★ පෙළ සාහිත්‍යක් තිබීම
- ★ ප්‍රේක්ෂක ප්‍රතිචාර මතවෙනස් වීම.

(04) I ශිථිලකරණ අභ්‍යාස. (02)

II. සංවේදන අභ්‍යාස, ස්වසන අභ්‍යාස, මානසික අභ්‍යාස, හඬ අභ්‍යාස, චිත්ත ඒකග්‍රතාවය ඇති කරන අභ්‍යාස (04)

III.
- ★ ශාරීරික මානසික සමබරතාවය ඇතිකර ගැනීම.
- ★ ශාරීරික නම්‍යශීලි බව ඇතිකර ගැනීම.
- ★ සැහැල්ලු බව ලබාගැනීම.
- ★ ආකල්ප වර්ධනය කරගත හැකි වීම.
- ★ සබකෝලය දුරුකරගත හැකිවීම.
- ★ සාමුහික ක්‍රියාකාරකම් වලට හුරුවීම............. ආදිය සඳහා (06)

(05) I.
- ★ සන්නියකුම (දහඅට සන්නිය)
- ★ රටයකුම (රිද්දියාගය)
- ★ සූනියම් යාගය (02)

II.

| සන්නියකුම | රටයකුම |
|---|---|
| ★ සන්නියකුන් පැන්නීම | ★ කපුයක්කාරිය |
| ★ මහකෝළ සන්නිය | ★ දොළහ පෙළපාලය (නානුමුරය) (04) |

III. සමාරෝපය, අනුකරණය, සංවාද භාවිතය, වෙස්ගැන්වීම්, අවස්ථා නිරූපණය ආදිය නිදසුන් මගින් ඉදිරිපත් කර ඇත්නම්. (06)

(06)
- ★ සංවාද දෙබස් සහිත පෙළ රචනය (04)
- ★ නාට්‍යෝචිත අවස්ථා නිර්මාණය (04)
- ★ නම් කිරීම හා නිශ්චිත අවසානයට (04)